ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

C-CAMP හි ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ **ආචාර්ය** තස්ලිමරිෆ් සයෙඩ් මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේ

C-CAMP (Centre for Cellular and Molecular Platforms) හි ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ ආචාර්ය තස්ලිමරිෆ් සයෙඩ් මහතා 2026 සැප්තැම්බර් 3- 4 දිනවල ශ්‍රී ලංකා සංචාරයක නිරත විය.

2. C-CAMP යනු ඉන්දියාවේ ප්‍රමුඛතම ජීවන විද්‍යා පර්යේෂණ, නවෝත්පාදන සහ ජෛව ඉන්කියුබේෂන් මධ්‍යස්ථානයකි. ඉන්දිය රජයේ ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය හිමි වන මෙම ආයතනය 2009 වර්ෂයේ සිට ජීවන විද්‍යා ක්ෂේත්‍රයේ නවීන පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා නම් දැරූ කීර්තිමත් ආයතනයකි. එය අති නවීන තාක්ෂණික වේදිකාවන් හරහා පර්යේෂණ, සංවර්ධන, පුහුණු සහ සේවා සපයමින් ජෛව විද්‍යා පර්යේෂණ සහ ව්‍යවසායකත්වය සඳහා සහය ලබා දෙයි.

3. සහයෝගීතාවය සඳහා අවස්ථාවන් පවතින ක්ෂේත්‍ර පිළිබඳව සොයා බැලීමේ අරමුණින් ආචාර්ය සයෙඩ් මහතා ශ්‍රී ලංකා රජයේ විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය මහාචාර්ය කරිෂාන්ත අබේසේන මැතිතුමා සහ සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය හංසක විජේමුණි මහතා හමු විය. එසේම, එතුමා විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ජනාධිපති ජයෂ්ඨ උපදේශක මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මහතා ද හමු විය.

4. මහාචාර්ය සයෙඩ් මහතා සිය සංචාරය අතරතුරදී ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ ප්‍රධාන පලෙේ නායකයන් ද හමු විය.

5. මෙම නියැලීම් තුළින් විද්‍යා ක්ෂේත්‍රයේ හුවමාරු පුළුල් කරමින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ දිනෙන් දින ගැඹුරු වන හවුල්කාරිත්වය පිළිබිඹු කරෙේ.

6. මහාචාර්ය සයෙඩ් මහතාගේ සංචාරය දරෙටහි ප්‍රාරම්භක සමාගම්, තාක්ෂණික අධ්‍යාපනය සහ කෘත්‍රිම බුද්ධිය යන අංශවල දැනට ක්‍රියාත්මක සහයෝගීතාවය ඉදිරියට ගෙන යමින් මෙම හවුල්කාරිත්වයට ශක්තිමත් ජෛව විද්‍යා සහ ව්‍යවසායකත්ව පැතිකඩක් එක් කරයි. එය විද්‍යා සහයෝගිතාවය දරෙට සඳහාම ප්‍රතිලාභ ගෙන දීම සඳහා භාවිතා කිරීමට ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පොදු කැපවීම යලින් අවධාරණය කරයි.

***

කොළඹ

2026 සැප්තැම්බර් 23